**ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය - 2023**

**-------------------------------------------------**

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2019 මැයි 14 දිනැති 6371 - එල්කේ අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර ගිවිසුම්ගත ණය ගිවිසුමේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 04 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රජාවන්ට ප්‍රතිචාරාත්මකව හා වගවීමකින් යුතුව සේවා සැපයීම සඳහා පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම සහ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සහභාගී වන පළාත්වලට සහය වීම වේ. ණය සහ ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 17,665.63කට සමාන එජඩො මිලියන 100.65ක් වන අතර ඉන් රු.මිලියන 12,222.41කට සමාන එජඩො මිලියන 70ක් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 4,220.98කට සමාන එජඩො මිලියන 23.65ක් මූල්‍යායනය කිරීම යුරෝපා සංගමය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුනි 30 දින ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති කාලය 2024 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.3 වගන්තිය | රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරියෙකු ඔහුගේ /ඇයගේ අදාළ තනතුරේ සේවය කරන අතරතුර වැඩ බැලීමේ පදනම මත ව්‍යාපෘතියක සේවය කිරීමට මුදාහැරිය හැකිය. කෙසේ | උතුරු මැද පළාත වැඩිපුර ගෙවූ මුදල අයකරගෙන නොමැත. උතුරු මැද පළාත් පාලන කොමසාරිස්වරයා එම | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ගෙවන ලද වැටුප් අයකර ගැනීමට කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | වෙතත්, චක්‍රලේඛවල විධිවිධානවලට පටහැනිව, උතුරු මැද පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක ලෙස පත් කර රුපියල් 683,000 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | මුදල ව්‍යාපෘතියට ගෙවා නොමැති බව පුරානැගුම ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා දන්වා ඇත. | කළ යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන සැලසුම් පද්ධතිය ශක්තිමත් කිරීම, පළාත් පාලන සේවා සහ ආර්ථික යටිතල පහසුකම් සහාය සහ ආයතනික සංවර්ධනය වැඩිදියුණු කිරීම යන සංරචකවල අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 80ක්, සියයට 70ක් සහ සියයට 85ක් වුවද තත්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 45ක්, සියයට 66ක් සහ සියයට 30 ක් විය. | අදහස් දක්වා නොමැත. | සියලු පාර්ශවයන්ගේ අපේක්ෂිත ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |

**3.2 නිශ්කාර්ය /භාවිතයට නොගත්/ ඌන උපයෝජිත සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| බහුවිධ හේතූන් මත (උපකරණ සපයා නොතිබීම, නීතිමය ආරවුල්, විදුලි කාන්දුවීම්, අදාළ කාර්ය මණ්ඩලය නොමැතිකම, විදුලිය නොසැපයීම, සැලසුම් අසාර්ථක වීම, වෙළඳ කුටි ටෙන්ඩර් කර නොතිබීම) උතුරු මැද, ඌව සහ නැගෙනහිර යන පළාත්වල රුපියල් මිලියන 402.22ක් වටිනා වත්කම් 23 ක් වාර්තා කරන දිනට මාස 5 සිට මාස 12 දක්වා නිශ්කාර්යව පැවතුනි. | අදහස් දක්වා නොමැත | වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදාත්මක ස්වභාවයේ ගැටලු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | **ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 5.3 ඡේදයට අනුකූල නොවීම**<br><br>මූලික වාරික 02 නිදහස් කිරීම සඳහා වූ දෙවන නිර්ණායකයට අනුව, සමාජ විගණන කමිටු පිහිටුවීමේ දී අවම වශයෙන් සියයට 50 ක කාන්තා සහභාගීත්වයක් තිබිය යුතු අතර අදාළ පළාත් පාලන ආයතනයේ මහා සභා රැස්වීමෙන් එම කමිටුව සඳහා අනුමැතිය ලබා ගත යුතුය. විගණනයට තොරතුරු ඉදිරිපත් කළ ආයතන 67 න් ආයතන 04 ක සමාජ විගණන කමිටු ස්ථාපිත කර නොතිබූ බවත්, ආයතන 27 ක කාන්තා සහභාගිත්වය සියයට 50 ට වඩා අඩු බවත්, ආයතන 47 ක කමිටු සඳහා මහ සභා අනුමැතිය ලැබී නොතිබූ බවත් නිරීක්ෂණය විය. නමුත් ව්‍යාපෘතිය මගින් සියයට 50 ට වඩා අඩු කාන්තා සහභාගීත්වයක් ඇති සියලුම ආයතන වෙත දෙවන මූලික වාරික මුදල් නිකුත් කර තිබුණි. | දෙවන වාරිකය නිකුත් කිරීමට පෙර සුදුසුකම් ලැබීම සඳහා නිර්ණායක 05ක් සම්පූර්ණ කළ යුතුය. කෙසේ වෙතත්, 2020 සහ 2021 වසරවල කොවිඩ් 19 වසංගත තත්ත්වය වැනි නොවැළැක්විය හැකි තත්ත්වයන් හේතුවෙන් සමහර පළාත් පාලන ආයතනවලට පිරිසිදු විගණන මතය හැර එක් නිර්ණායකයක් හෝ සපුරාලීමට නොහැකි වී ඇත. මෙම සන්දර්භය තුළ, ජනතා අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් මුදා හරින බැවින් මහජනතාව විසින් තෝරාගත් උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දෙවන මූලික වාරික නිකුත් කර ඇත. පෙර වසර සඳහා, පිරිසිදු විගණන මතයේ නිර්ණායකය සපුරාලීමකින් තොරව ව්‍යාපෘතිය කිසි විටෙකත් පළාත් පාලන ආයතන වෙත දෙවැනි මූලික වාරිකයක් නිකුත් කර නැත. | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන අනුව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | රාජාංගනය ප්‍රාදේශීය සභාව පුත්තලම හන්දියේ රජයේ ඉඩමක BT 2 සහ BT3 යටතේ රු.47,545,091ක් වැයකර කඩ 08ක් සහිත සාප්පු සංකීර්ණයක් ඉදිකර තිබුණ ද ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර එම ඉඩමේ අයිතිය පවරා දී නොතිබුණි. 2005 වසරේ ප්‍රාදේශීය සභාව සහ පෞද්ගලික පාර්ශවයක් අතර ඇතිකරගත් ගිවිසුමකට අනුව ප්‍රාදේශීය සභාව ලබාදුන් ප්‍රමිතීන්ට අනුව මෙම ඉඩමේ කඩසාප්පු ඉදිකර ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අවසර ලබාදී තිබුණි. එසේ වුවද පෞද්ගලික පාර්ශවය විසින් මේ සම්බන්ධයෙන් නඩු පවරා ඇති අතර 2023 වර්ෂයේදී (එක් පැමිණිලිකරුවෙකු සඳහා) නඩු පැවරීම සඳහා රු.15,000ක් ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ඉඩමේ අයිතිය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | කෙසේ වෙතත්, ඉඩමේ අයිතිය නිරවුල් නොකර ඉදිකිරීම් සිදු කිරීම හේතුවෙන් ඉදිකරන ලද සාප්පු සංකීර්ණය අපේක්ෂිත අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. | | |
| (ඇ) | මිහින්තලය ප්‍රාදේශීය සභාව විසින් PT-1 ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය සහ දුෂ්කර ප්‍රදේශ සඳහා වීදි ආලෝකය සැපයීම වෙනුවෙන් වීදි ලාම්පු කට්ටල 40ක් මිලදීගැනීමට සමාගම් 05කින් මිල ගණන් කැඳවා 2021 දෙසැම්බර් 23 දින රු.539,070ක අඩුම මිල ඉදිරිපත් කළ සමාගමෙන් මිලදී ගෙන තිබුණි. 2022 ජනවාරි 19 වන විට වීදි ලාම්පු 03ම ක්‍රියා විරහිත බව ප්‍රදේශවාසීන් සභාවට දන්වා තිබුණි. කෙසේ වෙතත් වගකීම් කාලයක් යටතේ බල්බ මිලදී නොගැනීම හේතුවෙන් එම බල්බ ප්‍රතිස්ථාපනය කිරීමට ප්‍රාදේශීය සභාවට නොහැකි වී තිබුණි. | -එම- | තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව නිසි වෘත්තීය සැලකිල්ලෙන් ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් රු.36,904,177 ක වියදමින් කටුපත්වැව ප්‍රදේශවාසීන්ට පානීය ජලය ලබාදීමේ ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතියට අදාළව ළිඳක් සහ පොම්පාගාරයක් ඉදිකර ඇති ඉඩම ප්‍රාදේශීය ලේකම්වරයාගේ බලපත්‍රයක් ඇතිව පෞද්ගලික පාර්ශවයන් විසින් පරිහරණය කරන ලද ඉඩමක් වන අතර ඔහුගේ අනුමැතිය සහ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම්වරයාගේ ලිඛිත අවසරය ඇතිව මෙම ඉදිකිරීම් සිදු කර තිබූ නමුත් ව්‍යාපෘතිය සඳහා භාවිතා කරන ලද ඉඩම් කොටස විගණිත දිනය වන විටත් විධිමත් ලෙස ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නොතිබුණි. | -එම- | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීම වැනි මූලික කටයුතු සිදු කළ යුතුය. |

(ඉ) කලපු පාර, පුන්නකුඩා පාර සහ ත්‍රිකුණාමලය පාරේ ජංගම වෙළඳසැල් පිහිටුවීම හරහා කුඩා මට්ටමේ ව්‍යාපාරික ප්‍රජාවන් සවිබල ගැන්වීම.

| | | |
|---|---|---|
| • අඩි 20 බැගින් දිග කන්ටේනර් හතක් මිල දී ගෙන, රු.2,399,736 ක සාමාන්‍ය වියදමින් එක් බහාලුමක් 10.0'x8.0'x8.0' ප්‍රමාණය වන සේ වෙළඳසැල් 2 ක් ලෙස නිර්මාණය කර තිබූ අතර රු.16,798,152 ක මුළු පිරිවැයකට කඩ 14 ක් ඉදිකර තිබුණි. ඒවා අඩි 40 ක් දිග වන සේ කන්ටේනර් 2 ක් සම්බන්ධ කර ස්ථාන 3 ක තබා තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතියේ දී කාත්තන්කුඩි නගර සභාව විසින් අඩි 40ක් දිග කන්ටේනරයක් මිල දී ගෙන තිබූ අතර, 10.0'x8.0'x8.0' ප්‍රමාණයේ වෙළඳසැල් 4ක් ඉදිකිරීම සඳහා රු.2,493,670ක් වැය කර තිබුණි. නමුත් අඩි 20 බැගින් දිග කන්ටේනර් 6ක් වෙනුවට අඩි 40 බැගින් දිග කන්ටේනර් 3ක් මිලට ගෙන වෙළෙඳ සංකීර්ණයක් ඉදිකළේ නම් එරාවූර් නගර සභාවට රු.6,964,517ක් ඉතිරි කර ගත හැකිව තිබුණි. | -එම- | ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණ සහතික විය යුතුය |
| • මෙම කොන්ත්‍රාත් කාර්යය සඳහා රු.2,519,723 ක් වැට් බද්ද ලෙස කොන්ත්‍රාත්කරු (M/S Aramjee Group) වෙත ගෙවා තිබුණ ද, එරාවූර් නගර සභාව විසින් ගෙවන ලද වැට් බද්ද පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැනුවත් කර නොතිබුණි. | -එම- | වැට් බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබිය යුතුය |

## 3.4 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| ණය ගිවිසුමේ 02 උපලේඛනයේ (ඇ) වගන්තිය අනුව, පළාත් සභා 04 සමග ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාළ පළාත් සභා යටතේ සියලුම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක පිහිටුවා ඇත. ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව සියලුම ප්‍රධාන ලේකම්වරුන් පළාත් ජාතික මෙහෙයුම් කමිටුවේ ප්‍රධානත්වය දරන අතර ප්‍රධාන ලේකම්වරුන් ජාතික මෙහෙයුම් කමිටුව ද නියෝජනය කරනු ලැබේ. | ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගත යුතුය. |